## නියමයන් සහ කොන්දේසි - Round- Up ඉතුරුම්

පහත සඳහන් නියමයන් සහ කොන්දේසි FriMi හරහා විවෘත කරන ලද Round-Up ඉතුරුම් ගිණුම් පාලනය කරනු ඇත.

**පහත "පිළිගනිමි" යන බොත්තම එබීමෙන්, ගනුදෙනුකරු පහත පරිදි**

**එනම් මෙම නියමයන් සහ කොන්දේසි, Round-Up ඉතුරුම් ගිණුම් අදාළ විස්තර සමඟ ගනුදෙනුකරුට පැහැදිලි කර ඇති බවත් ගනුදෙනුකරු මෙම නියමයන්, කොන්දේසි සහ එවැනි විස්තර කියවා තේරුම් ගෙන ඇති බවත් ඒ අනුව බැඳී සිටීමට එකඟ වන බවත් පිළිගෙන තහවුරු කරයි.**

### ගිණුම විවෘත කිරීම

1. **ගනුදෙනුකරු හඳුනා ගන්න** (KYC) සත්‍යාපනය සම්පූර්ණ කිරීම අනුව බැංකුව විසින් සක්‍රිය කර ඇති FriMi ඉතුරුම් ගිණුමක් ඇති ගනුදෙනුකරුවෙකුට Round-Up ඉතුරුම් ගිණුමක් විවෘත කළ හැක.
2. ගනුදෙනුකරුවෙකු විසින් FriMi යෙදුමේ Round-Up ඉතුරුම් විකල්පය සක්‍රියකළ විට, ගනුදෙනුකරු විසින් සපයන ලද නවතම ගනුදෙනුකරු හඳුනා ගන්න තොරතුරු භාවිතා කරමින්, ගනුදෙනුකරුගේ නමින් Round-Up ඉතුරුම් ගිණුමක් විවෘත කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුවට සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.
3. Round-Up ඉතුරුම් ගිණුමක බැර සහ හර පහත සඳහන් ගනුදෙනුවලට සීමා කෙරේ.
   - FriMi ඉතුරුම් ගිණුමෙන් ගෙවීම් ගනුදෙනුවකට අදාළව Round-Up මුදල් මාරු කිරීම; සහ
   - FriMi ඉතුරුම් ගිණුමට මුදල් මාරු කිරීම.
4. සෑම Round-Up ඉතුරුම් ගිණුමක් ම FriMi හි පවත්වාගෙන යනු ලබන ගිණුම් ගණයට වැටෙන අතර Round-Up ඉතුරුම් ගිණුම සම්බන්ධයෙන් අදාළ වන පොලී අනුපාතය සහ බදු FriMi යෙදුම තුළ ප්‍රකාශයට පත් කෙරේ.
5. Round-Up ඉතුරුම් ගිණුම් සඳහා ගනුදෙනුකරු වෙත ඉලෙක්ට්‍රොනික ගිණුම් ප්‍රකාශ නිකුත් නොකරනු ඇති අතර පවතින බැංකු ගාස්තුවලට යටත්ව ඉල්ලීම මත පමණක්ගිණුම් ප්‍රකාශ නිකුත් කරනු ලැබේ.
6. ගනුදෙනුකරුට FriMi යෙදුම හරහා Round-Up ඉතුරුම් ගිණුම්වල ගනුදෙනු ඉතිහාසය බැලිය හැකි වේ.
7. සෑම Round-Up ඉතුරුම් ගිණුමකටම ගිණුම් අංකයක් ලබා දෙනු ඇති අතර බැංකුව සමඟ ඇති සියලුම ලිපි හුවමාරුවන්හි දී එය සඳහන් කළ යුතුය.

### Round-Up ඉතුරුම් ගිණුමේ මෙහෙයුම්

8. FriMi යෙදුමේ සපයා ඇති පරිදි ගනුදෙනුකරුට Round-Up අගය තේරීමේ විකල්පය ඇත.
9. ගනුදෙනුකරුවෙකු විසින් Round-Up ඉතුරුම් විකල්පය සක්‍රිය කළ පසු, Round-Up මුදල ස්වයංක්‍රීයව FriMi ඉතුරුම් ගිණුමෙන්, Round-Up ඉතුරුම් ගිණුමට මාරු කරනු ලැබේ (FriMi ඉතුරුම් ගිණුමේ ප්‍රමාණවත් තරම් මුදල් ඇත්තේ නම්) .
10. FriMi ඉතුරුම් ගිණුම හරහා සිදු කරනු ලබන ගෙවීම් ගනුදෙනු සඳහා පමණක් Round-Up ඉතුරුම් විකල්පය අදාළ වේ.
11. FriMi ඉතුරුම් ගිණුමේ ඇති ශේෂය ගෙවීම් ගනුදෙනුව සිදු කරන අවස්ථාවේ දී Round-Up මුදල මාරු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම්, එම ගෙවීම් ගනුදෙනුව සම්බන්ධයෙන් Round-Up ට බලපෑමක් ඇති නොවේ. තවද, පසුව FriMi ඉතුරුම් ගිණුමට ප්‍රමාණවත් ලෙස අරමුදල් ලැබුණු පසු Round-Up මුදල අය නොකෙරේ.
12. ගනුදෙනුකරුට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ගනුදෙනුකරු විසින් තෝරා ගන්නා ලද Round-Up අගය වෙනස් කළ හැකි වේ.
13. Round-Up ඉතුරුම් විකල්පය යටතේ, අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී Round-Up අගය වෙනස් කිරීමට බැංකුවට අයිතිය ඇත.
14. ගෙවීම් ගනුදෙනුවක් ආපසු හැරවීමට ගනුදෙනුකරු ඉල්ලා සිටින්නේ නම්, එම ගෙවීම් ගනුදෙනුව සඳහා වන Round-Up අගය ආපසු හැරවීම සිදු නොවේ.

### ROUND-UP ඉතුරුම් විකල්පය අවසන් කිරීම

15. ගනුදෙනුකරුට අවශ්‍ය ඕනෑම අවස්ථාවක Round-Up ඉතුරුම් විකල්පය "වසා දැමිය හැක". එවැනි අවස්ථාවක, Round-Up ඉතුරුම් ගිණුමේ ඇති සියලුම අරමුදල් ස්වයංක්‍රීයව ගනුදෙනුකරුගේ FriMi ඉතුරුම් ගිණුමට මාරු කෙරෙනු ඇත.

16. ගනුදෙනුකරුට අවශ්‍ය ඕනෑම අවස්ථාවක Round-Up ඉතුරුම් විකල්පය "විරාම කිරීම" සහ "නැවත ආරම්භ කිරීම" කළ හැක. එවැනි අවස්ථාවක, Round-Up ඉතුරුම් ගිණුමේ ඇති අරමුදල් Round-Up ඉතුරුම් ගිණුමේ පවතිනු ඇත.
15. Round-Up ඉතුරුම් ගිණුම වසා දැමීමෙන් පසු, **එම** වසා **ඇති** Round-Up ඉතුරුම් ගිණුම හරහා ගනුදෙනු කිරීමට ගනුදෙනුකරුට අවසර නොලැබේ.
16. ගනුදෙනුකරු වෙත දැනුම් දී Round-Up ඉතුරුම් ගිණුම වසා දැමීමේ අයිතිය බැංකුව සතු වන අතර එවැනි වසා දැමීමකදී එහි ඇති මුදල් FriMi ඉතුරුම් ගිණුමට මාරු කෙරෙනු ඇත.

**විවිධ**

17. මෙහි සඳහන් කර ඇති ප්‍රතිවිරුද්ධ වූ කිසිවක් නොසළකා, ගනුදෙනුකරුගේ Round-Up ඉතුරුම් ගිණුම සමඟ ගනුදෙනුකරු බැංකුව වෙත ඇති ඕනෑම වගකීමක් ඒකාබද්ධ කිරීමට සහ එවැනි වගකීම් සත්‍ය හෝ අවිනිශ්චිත ද, ප්‍රාථමික හෝ ඇපකර සහිත ද සහ එක්ව හා වෙන් වෙන්ව ද යන්න අනුව වෙනත් ඕනෑම ගිණුමක් මත හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් ගණුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු වෙනත් මුදලකට එදිරිව Round-Up ඉතුරුම් ගිණුමෙන් බැර කිරීමට යම් මුදලක්/හිමි මුදලක් නියම කිරීමට හෝ මාරු කිරීමට ගනුදෙනුකරු සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.

18. ඕනෑම අවස්ථාවක මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතු වේ. එවැනි වෙනස්වීම් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් කරනු ඇත.

19. මෙම නියමයන් සහ කොන්දේසිවල සංශෝධන නීතියෙන් අවශ්‍ය වන්නේ නම් මෙම නියමයන් සහ කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වනු ඇත.

20. මෙහි අන් ලෙසකින් නිර්වචනය කර නොමැත්තේ නම් මිස, මෙම නියමයන් සහ කොන්දේසි වල ඉංග්‍රීසි කැපිටල් අකුරින් දක්වන ලද නියමයන් ද ගනුදෙනුකරු විසින් දැනටමත් පිළිගෙන ඇති FriMi නියමයන් සහ කොන්දේසි වල ("ප්‍රධාන ගිවිසුම") දක්වා ඇති අර්ථයම ගනී.

21. මෙම නියමයන් සහ කොන්දේසි ප්‍රධාන ගිවිසුමේ විධිවිධාන සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර නියමයන් සහ කොන්දේසි (ඉල්ලීම මත ලබා ගත හැකි පිටපත්) සමඟ කියවිය යුතුය. එවැනි නියමයන් සහ කොන්දේසි මෙහි ඇතුළත් කර තිබේද නැද්ද යන්න නොසලකමින් ගනුදෙනුකරු එවැනි සියලුම නියමයන් සහ කොන්දේසිවලට බැඳී සිටී.

**අර්ථ දැක්වීම්**

**"බැංකුව"** යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. (PQ 118) අදහස් වේ.

**"Round-Up මුදල**" යන්නෙන් අදහස් වන්නේ තෝරාගත් Round-Up අගය මත පදනම්ව ගෙවීම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් FriMi ඉතුරුම් ගිණුමෙන් හර කරනු ලබන මුදලයි;

**"Round-Up ඉතුරුම් විකල්පය"** හෝ **"Round-Up"** යන්නෙන් අදහස් වන්නේ FriMi යෙදුමේ ඇති විකල්පයකි, එමගින් ගනුදෙනුකරුවන්ට FriMi බැංකු ගිණුම භාවිතයෙන් සිදු කරන ලද සියලුම හර ගනුදෙනු ආසන්න ම අගයට වටයා එම වැටයීමේ දී ලැබෙන අතිරික්තය ඉතිරි කිරීමට ඉඩ සලසා දේ. මෙම ඉතුරුම් ස්වයංක්‍රීයව Round-Up ඉතුරුම් ගිණුමට මාරු කෙරෙනු ඇත.

**"Round-Up ඉතුරුම් ගිණුම"** යන්නෙන් අදහස් වන්නේ, FriMi යෙදුම මත Round-Up ඉතුරුම් ගිණුම් විකල්පය සක්‍රිය කරන අවස්ථාවේ දී ගනුදෙනුකරු වෙනුවෙන් බැංකුව විසින් විවෘත කරන ලද Nations Saver ඉතුරුම් ගිණුම් ගණයට අයත් වන්නා වූ බැංකුවේ ඉතුරුම් ගිණුම් නිපැයුම්කි.

**"Round-Up අගය"** යන්නෙන් අදහස් වන්නේ Round-Up ඉතුරුම් විකල්පය යටතේ තෝරාගත් මුදලයි

**˜KYC˜** යන්නෙන් අදහස් වන්නේ ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න යන්නය.